Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. — ඔබේ අංකය / உமது இல. / Your No. — දිනය / திகதி / Date: 2019-08-29

පැමිණිලිකරු : වෛද්‍ය කේ.ජ්.ඩී.සී. ජයලත් මහතා,
අංක : 19/ජ්/2,
හන්තාන පෙදෙස,
මහනුවර.

වගඋත්තරකරුවන් : 1. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ජාතික පාසල් අධ්‍යක්ෂ,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

<u>**පැමිණිලි අංකය : HRC/K/310/15**</u>

**පැමිණිල්ලේ කරුණු සැලකිරීම :-**

උක්ත පැමිණිලිකරු වන වෛද්‍ය ජයලත් මහතා විසින් 2014.06.12 දිනෙන් යුතුව මානව හිමිකම කොමිෂන් සභාව, මහනුවර ප්‍රාදේශිය කාර්යාලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, තමා MA/MS/B/1/2012 සහ 2012.12.06 දරණ ලිපිය මගින් ගම්පල මූලික රෝහලේ සිට මහනුවර මහ රෝහල වෙත 2013.01.01 දින සිට වාර්ෂික ස්ථාන මාරු ලැබ පැමිණි බවත්, ඒ වනවිට තම වැඩිමහල් දියණිය මහනුවර උසස් බාලිකා විද්‍යාලයේ 4 වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබමින් සිටි බවත්, තමාගේ දෙවන දියණිය වන කේ.ජ්.එස්.ඩී.ජයලත් දැරිය 2012 වසරේ පළමු වසරට ඇතුලත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශයේ අංක : 2013/23 දරණ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk

2013.05.23 දිනැති චක්‍රලේඛනය පරිදි සහෝදර පදනම, ස්ථාන මාරු සහ ආසන්න පදිංචිය යටතේ ඉහත පාසැල සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලැබූ බවත්ය.

එහිදී තම අයදුම්පත් ප්‍රතික්ෂේප වූ බවත්, ඒ අනුව ඊට පෙර වසර වලදී මෙන් තමා නියෝජනය වන වෘත්තිය සමිති වන රජයේ වෛද්‍ය නිලධාරි සංගමය මගින් මෙම ප්‍රශ්ණගත කාරණයට අදාලව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ පෙත්සම සහ (253/2011) එහිදී ඇතිකරගෙන තිබූ සමථය සහ තීන්දුව අනුව අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කල බවත්, ඒ අනුව රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ ලේකම්වරයා විසින් අධ්‍යාපන ලේකම්වරයා වෙත දිවයින පුරා වෛද්‍යවරුන්ගේ දරුවන් 202 දෙනෙකු පිළිබඳව ඉල්ලීම් ඉදිරිපත් කර තිබූ බවත්, එම ලේඛනයේ තම දියණියගේ නම මහනුවර උසස් බාලිකා විදුහල සඳහා ඇතුලත් කර තිබූ බවත් සඳහන් කර ඇත. ඉහත අභියාචනා ලයිස්තුව අනුව අධ්‍යාපන ලේකම්වරයා විසින් පළමුව දරුවන් 96 ක් ඇතුලත් කිරීමට 2014.04.30 දිනෙන් යුතු ලිපියකින් අවසර ලබාදී ඇති බව සඳහන් කර ඇති අතර පසුව 2014.06.03 දින තවත් දරුවන් 20ක් ඇතුලත් කිරීමට අවසර ලබාදී ඇති බවත්, නමුත් ඉහත ලේඛන දෙකෙහිම තම දරුවාගේ නම ඇතුලත්ව නොතිබූ බවත් සඳහන් කර ඇත.

පසුව අධ්‍යාපන ලේකම්වරයාගෙන් මේ සම්බන්ධයෙන් විමසීම් කිරීමේදී, 2014.07.01 දිනෙන් පසුව පාසැල් වලට ළමයින් ඇතුලත් කිරීම නවතා ඇති බවත්, 2014.12.02 දිනෙන් පසුව පැමිණි විමසන ලෙසත් දන්වන ලද බව සඳහන් කර ඇත. පසුව සිදුකරන ලද විමසීමේදී, පළමු ශ්‍රේණියට ඇතුලත් වීමට අවස්ථාව අහිමිවී තිබියදී 4 වන ශ්‍රේණිය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව අනුව දරුවන් ඇතුලත් කර ඇති බවත්, ඉන්පසුව නව රජය බලයට පත්වීමෙන් පසුව ඇති වූ නව තත්ත්වය තුල නැවත අධ්‍යාපන අමාත්‍යංශය වෙත අභියාචනය ඉදිරිපත් කල බවත්, අමාත්‍යංශය විසින් ඒ සඳහා EP/01/06/2015/CP/11 යොමු අංකය සහ 2015.03.11 දින ලබාදී ඇති බවත්, පසුව අධ්‍යාපන ලේකම්වරයා විසින් දරුවන් කිහිප දෙනෙකුට පමණක් පාසැල් ලබාදීමට කටයුතු කර ඇති බවත්, ඒ අනුව තමා සහ 2013 වසරේ ගම්පොල රෝහලේ සිට මහනුවර රෝහලට ස්ථාන මාරු ලැබූ වෛද්‍ය ජේ.එම්.ඩබ්ලිව්.ආර්. ගුණරත්න මියගේ දරුවාට මහනුවර ධර්මරාජ විදුහල ලබාදී ඇති බවත්, ඒ හා සමාන සුදුසුකම් සපුරා තිබූ තම දියණියට මහනුවර උසස් බාලිකා විදුහලට ඇතුලත් කර ගැනීමේ අවස්ථාව සලසා නොදුන් බවත්, සඳහන් කර ඇත.

ඒ අනුව 2015.05.15 දිනැතිව අංක : ED/116/1 -1 AD – 2015 අධ්‍යාපන ලේකම් විසින් යොමු කර ඇති ලිපිය මගින් 'තම දියණියට පාසලක් ලබාදිය නොහැකි බවට' තමා වෙත දන්වා ඇති බවත් සඳහන් කර ඇත. කෙසේ වෙතත්, ඒ වනවිට තම දියණිය මහනුවර ලක්පහන කතෝලික විදුහලට ඇතුලත් කර අධ්‍යාපන කටයුතු සිදුකරගෙනයාමට තමා අවස්ථාව සලසා දී තිබූ බවත්, එහිදී

බෞද්ධයකු වන තමාගේ දියණියට බුද්ධ ධර්මය වෙනුවට කතෝලික දහම අනිවාර්ය්‍ය විෂයක් ලෙස ඉගෙනීමට සිදුව ඇති බවත් සඳහන් කර ඇත.

ඉහත තත්ත්වය තුළ අධ්‍යාපන අමාත්‍යංශයේ එවකට ලේකම්වරයා විසින් සමාන සුදුසුකම් පැවතියදී තමා වෙනස්කමකට භාජනය කිරීම මගින් තම දියණියගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීමට කටයුතු කර ඇති බව ප්‍රකාශ කර ඇති අතර. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන මේ පිළිබඳව වැඩිදුර විමර්ශනයක් සිදුකර සහනයක් සලසා දෙන ලෙස ඉල්ලා සිට ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු සැලකිරීම් :-

පැමිණිල්ලට අදාළව සිදුකරන ලද පරීක්ෂණයේදී කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ. මේ සම්බන්ධයෙන් 2017.05.08 දිනැතිව ජාතික පාසැල් අධ්‍යක්ෂ ජයන්ත වික්‍රමනායක මහතා විසින් ලබාදී ඇති ලිඛිත පිළිතුරු අනුව වර්තමාන රජයේ අවශ්‍යතාවය මත ස්ථාන මාරු ලබන රජයේ සේවකයින් විශාල සංඛ්‍යාවකගේ අදාළ ස්ථාන මාරු පදනම් කරගෙන ජනප්‍රිය පාසල් ලබාදීමේ හැකියාවක් නොමැති බවත්. ඔවුන් තම දරුවන් ඇතුලත් කිරීමට අයදුම් කරන පාසලේ අදාල ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පුරප්පාඩු නොමැතිවීම ඊට ප්‍රධාන හේතුව බවත්. පුරප්පාඩු පැවති පාසල්වල ප්‍රමුඛතා පදනම මත සිසුන් ඇතුලත් කරගෙන ඇති අතර. පැමිණිලිකරු ඉල්ලීම් ඉදිරිපත් කරන අවස්ථාව වනවිට මහනුවර උසස් බාලිකා විදුහලේ පැවති පුරප්පාඩුව සම්පූර්ණ වී තිබූ බවත් ය.

කෙසේ වෙතත්. මේ සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවය පරීක්ෂණයේදී ප්‍රතිචාර දක්වමින් තමා ඉහත තත්ත්වය පිළිනොගන්නා බව ප්‍රකාශ කර ඇත.

නිරීක්ෂණ :-

පැමිණිලි පාර්ශවය සඳහන් කරන ආකාරයට තමා සමග ස්ථාන මාරු ලබා ගම්පොල මූලික රෝහලේ සිට මහනුවර මහ රෝහල වෙත පැමිණි වෛද්‍යවරියගේ දරුවා ධර්මරාජ විද්‍යාලයට ඇතුලත් කර ගෙන ඇති අතර. ඊට සමගාමී තමාගේ දියණිය 2015 වසරේ මහනුවර උසස් බාලිකා විදුහලේ දෙවන ශ්‍රේණියට ඇතුලත් කරගෙන නොමැති බව පැමිණිල්ලෙන් දක්වා ඇත.

2015.05.15 දිනැතිව එවකට අධ්‍යාපන අමාත්‍යංශ ලේකම් උපාලි මාරසිංහ මහතා විසින් පැමිණිලිකරු වන වෛද්‍ය ජයලත් මහතා වෙත යොමු කර ඇති ලිපියේ සඳහන් කර ඇති පරිදි එම මහතාගේ ඉල්ලීම ඉටු කළ නොහැකි බව සහ ඒ වනවිටත් වෛද්‍ය ජයලත් මහතාගේ දියණිය පාසැලක් ලැබී නොමැතිවීම මත කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ හමුවී සුදුසු පාසැලක් ලබාදෙන ලෙසට

දන්වා ඇති අතර, එම ලිපියේ අවසන් ජේදයට අවධානය යොමු කිරීමේදී මෙම තීරණය අවසානාත්මක තීරණය වන බව සහ නැවත සලකා නොබලන බවත් එබැවින් නැවත නැවත අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පැමිණීමෙන් වලකින ලෙසත් දන්වා ඇති බවද නිරීක්ෂණය වේ..

ඉහත ලිපිය පරිදි පැමිණිලි පාර්ශවය තම දියණිය ඇතුලත් කර ගැනීම සඳහා මහනුවර නගරයේ හෝ ආසන්න වෙනත් පාසැලක් ලබාගැනීමට කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ වෙනත් නිලධාරින් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර නොමැති බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

පැමිණිලිකරු විසින් විෂයගත කාරණයට අදාලව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ලට අදාලව පිළිගත හැකි පැහැදිලි පිළිතුරක් වගඋත්තර පාර්ශවය විසින් ලබානොදී ප්‍රමාද කර ඇති අතර, පසුව ප්‍රමාද වී ලබාදී ඇති පිළිතුරු ද ප්‍රමාණවත් නොවේ. ඒ අනුව පැමිණිලිකාර වෛද්‍ය ජයලත් මහතාගේ දියණිය මහනුවර උසස් බාලිකා විද්‍යාලේ දෙවන වසරට ඇතුලත් කර නොගැනීමට අදාලව පූරප්පාඩු නොමැතිවීම දක්වා ඇතත්, ඒ බව සනාථ කිරීමට අදාලව සාක්ෂි සහිත පිළිගත හැකි කරුණු දැක්වීමක් සිදුකර නොමැත.

මෙම තත්ත්වය තුළ වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකරු වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 වන වගන්තිය මගින් සහතික කර දී ඇති 'නීතිය ක්‍රියාත්මක කිරීම සර්ව සාධාරණ විය යුතුය' යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව පැමිණිලිකරුගේ දියණිය මහනුවර උසස් බාලිකා විද්‍යාලේ සමාන්තර ශ්‍රේණියකට ඇතුලත් කර ගැනීමට කටයුතු කළ යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019.09.30 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/ විදුහල්පති
මහ / උසස් බාලිකා විද්‍යාලය
මහනුවර.